සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**අවසාන වාර පරීක්ෂණය 2015**

# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

**08 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- අංක 01 10 දක්වා වූ ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

01 නිවසේ පරිසරය පුද්ගල සිතිවිලිවලට බලපාන මූලාශ්‍රයකි. ( )

02 මානව වර්ගයාට ඉමහත් සේවයක් කළ මහත්මා ගාන්ධි තුමා චින්තකයෙකි. ( )

03 භය ඇති වූ විට කථා කිරීමට අපහසුව දැකිය හැකි ලක්ෂණයකි. ( )

04 ශිෂ්‍යයකු ලෙස පාසල තුළ විනය නීති රීති පිළිපැදිය යුතු නොවේ. ( )

05 සුදුසු වේලාවක දී විවේකය ගැනීම එතරම් ගෝචර නැත. ( )

06 ස්ථිරසාර බව එතරම් වැදගත් දෙයක් නොවේ. ( )

07 තමාට තමන්ම නායකයෙකු වීම ඉතාම යෝග්‍ය වේ. ( )

08 පාලන නායකයින් නිතරම සතුටින් සිටිනු දැකිය හැකිය. ( )

09 නෙල්සන් මැන්ඩෙලා දැනට ජීවතුන් අතර සිටින නායකයෙකි. ( )

10 අධ්‍යාපනය ලබාදෙන ආයතනයක් ලෙස වෘත්තීය අධ්‍යාපන ආයතනය දැක්විය හැකිය. ( )

- අංක 11 සිට 15 දක්වා වූ ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11 අම්මා, තාත්තා, දරුවන් සිටින පවුල් න්‍යෂ්ටික පවුල් ලෙස හැඳින්වේ. මෙම කියමන

(1) නිවැරදිය (2) වැරදිය

(3) අනුමත කළ නොහැක (4) මේ කිසිවක් අදාළ නොවේ.

12 කිතුනු බැතිමතුන් ආගමික කටයුතු සඳහා යන දේවස්ථානයක් වන්නේ,

(1) වහකෝට්ටේ (2) කෝනේශ්වරම්

(3) ශ්‍රීපාදස්ථානය (4) කතරගම

13 ස්වභාවික විපත් අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ගයක් නොවන්නේ මින් කුමක් ද?

(1) වනාන්තර විනාශ නොකිරීම. (2) කැළෑ ගිනි තිබීම.

(3) කඳු බෑවුම් එළිපෙහෙළි නොකිරීම. (4) කොරල්පර කැඩීමෙන් වැළකීම.

14 විවිධ නායකත්ව ශෛලීන් බෙදිය හැකි කොටස් ගණන වනුයේ

(1) 5 කි. (2) 3 කි. (3) 6 කි. (4) 8 කි.

15 පෘථිවි පෘෂ්ඨයෙන් බීමට ගතහැකි ඇති ජලය ඇත්තේ කොපමණ ද?

(1) 70% (2) 77% (3) 1% (4) 0.1%

The National e-learning Portal for The General Education

- අංක 16   20 දක්වා වූ ප්‍රශ්නවලට අදාළව හිස්තැන් පුරවන්න.

(සුන්දරත්වය / පවුල / බහු සංස්කෘතික / පදිකයන්ගේ / ඵලදායීලෙස)

16 නිදහස .............................................. තුළ දැකිය හැකි ඉතාමත්ම වැදගත් ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණයකි.

17 ................................................... නොසැළකිලිමත්කම ද මාර්ග අනතුරුවලට බොහෝදුරට හේතුවේ.

18 ශ්‍රී ලංකාව ද ................................................................................... ජන සමාජයක් ඇති රටකි.

19 මානසික පීඩා .......................................................................... හසුරුවාගැනීම ඉතාම යහපත් ය.

20 සොබාදහමේ ..................................................................................... ඔබේ සිත සන්සුන් කරයි.

(2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) පණිවිඩ හුවමාරු සේවා මගින් ඉටුකරන කාර්යයන් 3 ක් ලියන්න.

(2) ප්‍රවාහන සේවා කාර්යක්ෂමව කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර 3 ක් ලියන්න.

(3) පෞද්ගලික අධ්‍යාපන ආයතන තුළින් රටකට ඇතිවිය හැකි අනිසි ප්‍රතිඵල 3 ක් ලියන්න.

(4) ජලය සුරක්ෂිත කර ගැනීමට අපට ගතහැකි ක්‍රියාමාර්ග 3 ක් ලියන්න.

(5) විශේෂ ප්‍රාගුණ්‍යය තුළින් ආයතනයකට ලැබිය හැකි ප්‍රයෝජන 3 ක් ලියන්න. (5 x 3 = 15)

02 (1) මිනිස් සිතේ පුදුමයෙන් ලොව පහළ වූ නිර්මාණ 3 ක් ලියන්න.

(2) ලොව අටවැනි පුදුමය නිර්මාණය කළේ කවුරුන් විසින් ද?

(3) සුභවාදී සිතිවිලි විස්තර කරන්න. (3 x 5 = 15)

03 (1) ගැටුමක් ප්‍රචණ්ඩකාරී ගැටුමක් බවට පරිවර්තනය වීම සඳහා හේතු විය හැකි කරුණු මොනවා ද?

(2) ගැටළු වළක්වා ගැනීමේ ක්‍රමවේද 5 ක් ලියන්න.

(3) ගැටළු නිරාකරණය සඳහා වර්ධනය කළ යුතු කුසලතා 5 ක් ලියන්න. (3 x 5 = 15)

04 (1) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ලක්ෂණ 3 ක් ලියන්න.

(2) නීති තුළ දැකිය හැකි පොදු ලක්ෂණ 3 ක් ලියන්න.

(3) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 3 ක් ලියා විස්තර කරන්න. (3 x 5 = 15)

05 (1) බුදුන් වහන්සේ තුළින් ගතහැකි නායකත්ව ලක්ෂණ 3 ක් ලියන්න.

(2) පොදු සේවාවල මූලික ලක්ෂණ 5 ක් ලියන්න.

(3) විවිධ චිත්තවේග 3 ක් ලියන්න. (3 x 5 = 15)